# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1996/6 - 2016 දෙසැම්බර් මස 05 වැනි සඳුදා - 2016.12.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය.*: අයිඑම්ඩීඑස්/එල්එන්ඩී/05/ඒසීකිව්/25/2005(13).

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතේ සංශෝධිත පරිදි ඉඩම් අත්කරගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ /පරවශතාවේ විස්තර :*

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඩවත කෝරළේ සීලගම ග්‍රාම නිලධාරි වසමේ පුවක්ගස්අරාව ගමේ පිහිටි රත්නපුර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අ.ග.පි 563 අතිරේක 07 හා 2011.02.14 දිනැති පිඹුරේ පහත සඳහන් ඉඩම් කැබල්ලට මායිම්.

**1. කැබලි අංක 161**

ඉඩමේ නම: උඩහවලව්වේ වත්ත *නොහොත්* පුවක්ගස්අරාවේ ගොඩවත්ත; ඉඩමේ විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: ඩබ්. එම්. කිරිබණ්ඩාර, සීලගම, බෙලිහුල්ඔය; ප්‍රමාණය: හෙක්. 0.0002.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 දෙසැම්බර් මස 16 වැනි දින පෙ.ව. 09.30ට ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා හමුවිය යුතු ය.

තව ද, 2016 දෙසැම්බර් මස 02 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා එය ගණනය කළ ආකාරයත් පිටපත් දෙකක් සහිත ලියවිල්ලකින් මා වෙත ඉදිරිපත් කළ යුතු ය.

ඩී. පී. ජී. රේණුකා,
ප්‍රාදේශීය ලේකම් (වැඩ ආවරණ),
ඉඹුල්පේ/ඉඩම් අත්කරගැනීමේ නිලධාරි,
රත්නපුර දිස්ත්‍රික්කය.

2016 නොවැම්බර් මස 30 වැනි දින,
ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12-797

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 24684 - 14 - (2016/12)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.